සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂය / பாடம் / Subject — බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I | පැය / மணித்தியாலம் / Hours 01 |

අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා, දී ඇති පිළිතුරු පත්‍රයේ අදාළ අංකය මත (X) ලකුණ යොදන්න.

(01) බෝසත් සිදුහත් කුමරාට ශිල්ප ලබා දුන් බමුණු පඬිවරයා වූයේ

1. අසිත පඬිවරයා ය.
2. කොණ්ඩඤ්ඤ පඬිවරයා ය.
3. චාණක්‍ය පඬිවරයා ය.
4. සර්වමිත්‍ර පඬිවරයා ය.

(02) සිදුහත් බෝසතාණන් වහන්සේ ජය ගත් අභියෝගයක් වන්නේ

1. අභිනිෂ්ක්‍රමණය කිරීමයි.
2. ශාක්‍ය ජනපදයේ රජ වීමයි.
3. උයන් කෙළියට යාමයි.
4. මාළිගා ඉදිකර ගැනීමයි.

(03) සිදුහත් කුමරු රම්‍ය,සුරම්‍ය,සුභ යන මාළිගවල ගෙවූ ජීවිතය අයත් වන්නේ

1. කාම සුඛල්ලිකානුයෝගයටයි.
2. අත්තකිලමථානුයෝගයටයි
3. මධ්‍යම ප්‍රතිපදාවටයි.
4. සන්‍යාසි පිළිවෙතටයි

(04) ශ්‍රී ලාංකේය බෞද්ධයාගේ උපතේ සිට මරණය දක්වා සෑම වැදගත් අවස්ථාවක දී ම මග පෙන්වීම සහ ආශිර්වාද ලබා දෙන්නේ

1. මරණාධාර සමිතියයි.
2. මහා සංඝරත්නයයි.
3. දේශපාලන නායකත්වයයි.
4. ග්‍රාම නිලධාරී මහතා ය.

(05) ක්‍රි.පූ. හය වන සියවසේ දී සිදුහත් බෝසතාණන් වහන්සේ බුදු වීම හා සමග ලෝකයට බුද්ධ රත්නයත්, ධර්මරත්නයත්, පහළ වූයේ වෙසක් පුන් පොහෝ දිනයක ය.අනතුරුව සංඝ රත්නය පහළ වූයේ

1. දුරුතු පොහොය දිනක ය
2. බක් පොහොය දිනක ය
3. පොසොන් පොහොය දිනක ය
4. ඇසළ පොහොය දිනක ය

(06) බුද්ධ,ධම්ම,සංඝ යන ත්‍රිවිධ රත්නයේ සූවිසි ගුණ, සංඛ්‍යා වශයෙන් වෙන් කර දැක්විය හැක්කේ

1. හය,අට,දහය ලෙසයි.
2. හත,අට,නවය ලෙසයි.
3. නවය,හය,නවය ලෙසයි.
4. නවය,හත,අට ලෙසයි.

(07) "කුමර බඹසර හා කුමරි බඹසර" යන ප්‍රතිපත්තිය අදාළ වන්නේ

1. විවාහයට පෙර ගිහියන්ටයි.
2. විවාහයට පසු ගිහියන්ටයි
3. සාමණේර හිමිවරුන්ටයි.
4. උපසම්පදා හිමිවරුන්ටයි.

(08) පාසලේ උපදේශනය භාර ගුරුතුමා හමුවූ නිමාලි පවසා සිටියේ තමන්ට නිදිමත සහ උදාසීනකම පාලනය කරගත නොහැකි බැවින් ගෙදර අභ්‍යාස කිරීම අතපසු වන බවයි.මේ අනුව නිමාලිගේ අධ්‍යාපනයට බාධා කරන්නේ,

1.කාමච්ඡන්දය යි.
2 . ව්‍යාපාදය යි.
3. ථීන මිද්ධය යි.
4. විචිකිච්ඡාව යි.

(09) බුදු දහමේ ඉගැන්වෙන භාවනාවෙහි පරමාර්ථය වනුයේ,

1.කුසල් අරමුණක සිත එකඟ කිරීමයි.
2.අඛණ්ඩව එකම අරමුණක් සිතීමයි.
3.සිත සිතිවිලි වලින් ශූන්‍ය කිරීමයි .
4.මනෝ විඤ්ඤාණය කයින් වෙන් කිරීමයි.

(10) නිවන් අරමුණ ඇති උතුමකුට කෙලෙස් මුල් උදුරා දමා සිත නැවත කිසි දිනක අපිරිසිදු නොවන තත්ත්වයට පත් කිරීම සඳහා උපකාර වන්නේ,

1.සමාධි භාවනාව යි.
2 . විපස්සනා භාවනාව යි.
3.සමථ භාවනාව යි.
4. ධ්‍යාන භාවනාව යි.

(11) බුදුදහමෙහි ඉගැන්වෙන "ප්‍රඥාව" යනු

1.පොත පතින් හා ගුරුවරුන්ගෙන් ලබන දැනුමයි.
2.තර්ක,විතර්ක මගින් ලබන දැනුමයි.
3.පරම්පරාවෙන් පැවත එන දැනුමයි.
4.ඇත්ත ඇති සැටියෙන් දැකීම නිසා ලබන දැනුමයි.

(12) බුදුදහමට සිදුකළ සේවාවන් නිසා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සංඝරාජ පදවියෙන් පුදන ලද්දේ,

1.හික්කඩුවේ ශ්‍රී සුමංගල මා හිමියන් ය.
2.වාදීභසිංහ මීගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමියන් ය.
3.අසරණ සරණ වැලිවිට සරණංකර මා හිමියන් ය.
4.වලානේ ශ්‍රී ධර්මාරාම මා හිමියන් ය.

(13) දුටුගැමුණු රජතුමාගේ ශාසනික සේවා යටතේ සිදු වූ ප්‍රධාන ඉදිකිරීම් තුනක් වන්නේ,

1.ථූපාරාමය,ජේතවනය හා අභයගිරියයි.
2. මහාසෑය,ලෝවාමහාපාය හා මිරිසවැටියයි
3.සීගිරිය,කිරිවෙහෙර හා කැළණි වෙහෙරයි
4. කිරි වෙහෙර ,ඉසුරුමුණිය හා ගල්විහාරයයි

(14) ධම්මපද උපදේශ අනුව කෙනෙකුගේ යසස වැඩෙන කරුණු අතරින් "සුචිකම්ම" යනුවෙන් දැක්වෙන්නේ

1.යහපත් කල්පනාවෙන් කටයුතු කිරීමයි.
2.තිදොරින් පිරිසිදු ක්‍රියා කිරීමයි.
3.ප්‍රමාද නොවී යහපතෙහි යෙදීමයි.
4.විමසා බලා කටයුතු කිරීමයි.

(15) ඕනෑම පිරිසක් මැදට නොබිය ව පැමිණිය හැක්කේ

(1) ධනවත් තැනැත්තාට යි
(2) බලවත් තැනැත්තාට යි
(3) සිල්වත් තැනැත්තාට යි
(4) කුලවත් තැනැත්තාට යි

(16) උදෑසන හය දිසාවකට නමස්කාර කරමින් සිටි සිඟාල නම් තරුණයාට බුදුදහම අනුව නිවැරදි සදිසා නමස්කාරය කියා දීමෙන් බුදුරජාණන් වහන්සේ,

1.සමාජ කණ්ඩායම් අතර බැඳීම ශක්තිමත් කළ සේක.
2. සමාජ කණ්ඩායම්වලට නීති රීති ඉදිරිපත් කළ සේක.
3.වෙනත් ආගමික ඉගැන්වීමකට අගතියක් කළ සේක.
4.සමාජ කණ්ඩායම්වල ආගම වෙනස් කළ සේක.

(17) "උපාධිධාරී තරුණයා නරක යහළුවන් ඇසුර නිසා සොරකමකට හසු වී සිරගත වේ." මෙම පුවත්පත් ශීර්ෂය දුටු අපේ පාසලේ ශිෂ්‍ය නායකයා කීවේ ,වරදට එරෙහි වීමට එම තරුණයාට කොන්දක් තිබී නැති බවයි.මෙයින් අදහස් වන්නේ එම උපාධිධාරී තරුණයාට

1.කශේරුකාවක් නැති බවයි.
2. නීතිය ගැන දැනුමක් නැති බවයි.
3.ප්‍රමාණවත් ධනයක් නැති බවයි.
4.යහපත් පෞරුෂයක් නැති බවයි

(18) ආගමික සමගිය වෙනුවෙන් රටේ ඕනෑම පුරවැසියකු විසින්

1. රටේ ඇති සියලු ම ආගම් ඇදහිය යුතු ය.
2. අන් අයගේ ආගමික නිදහසට බාධා නොකළ යුතු ය.
3. වෙනත් ආගමික ක්‍රියාවලට ඉඩ නොදිය යුතු ය.
4. අන්‍යාගමික උත්සව තමන් විසින් පැවැත්විය යුතු ය.

(19) මෙලොව ජීවත් වන මිනිසුන් අතර ආයුෂ,ලෙඩ දුක්,පැහැපත් බව,පොහොසත් බව, නුවණ ආදියෙහි අඩු වැඩි භේදයක් පැවතීමට හේතුව එම පුද්ගලයන්ගේ

1.ජාතියයි
2. පරිසරයයි.
3.කර්මයයි.
4. ධනයයි.

(20) දස අකුසල්වල.දී වාචසික අකුසල කර්මයක් ලෙස සැලකෙන ,"පිසුනාවාචා" යනු

1.අනුන් අසමගි වන වදන් ය
2. අනුන් රවටෙන වදන් ය
3.අනුන්ගේ සිත් රිදවන වදන් ය
4. හිස්,නිසරු වූ වදන් ය

(21) බුදු දහමෙහි ඉගැන්වෙන "පංච උපාදානස්කන්ධ" යනු

1.නාම රූප ධර්මයන් නිවැරදිව දැන ගැනීමයි.
2..නාම රූප ධර්මයන් නැති කර දැමීමයි.
3. විඤ්ඤාණය නිසා නාම රූප පහළ වීමයි.
4. නාම රූප ධර්මයන්හි තණ්හාවෙන් දැඩිව එල්බ ගැනීමයි.

(22) "නොනැසෙන ආත්මයක් ඇත." යන්න බුදු දහම අනුව

1. නැවත ඉපදීමට හේතු වන දෙයකි.
2.සැප දුක් විඳීම සඳහා අවශ්‍ය වන දෙයකි.
3.කැමති දේ ලබා දීමෙන් සුවපත් කළ යුතු දෙයකි
4.සිතින් මවා ගත් අසත්‍ය සංකල්පයකි.

(23) .අස්සජි මහ රහතන් වහන්සේ තමන්ගේ ගුරුවරයාගේ දහම ලෙස උපතිස්ස පිරිවැජියාට හඳුන්වා දුන්නේ

1.චතුරාර්ය සත්‍යයයි.
2. ත්‍රිලක්ෂණ ධර්මයයි.
3.පටිච්ච සමුප්පාදයයි.
4. කර්මය හා පුනර්භවයයි.

25o

(24) ලෝකයේ වස්තු, පුද්ගල, සිද්ධි ආදී සියල්ල ම

1.අන්‍යෝන්‍ය හේතු ප්‍රත්‍ය බලපෑමෙන් ක්‍රියාත්මක වේ.
2. අන්‍යෝන්‍ය බලපෑමෙන් තොර ව ස්වාධීන ව ක්‍රියාත්මක වේ.
3.අහේතු අප්පච්චය තත්ත්වයකින් ක්‍රියාත්මක වේ.
4. මිනිසාගේ කැමැත්තට යටත් ව ක්‍රියාත්මක වේ.

(25) මිනිසා ඉදිරියේ ඇති "සසර දුක්" නමැති මහා ප්‍රශ්නය විසඳා ගැනීමට අනුගමනය කළ යුතු සියලු පිළිවෙත් ඇතුළත් වන්නේ

1.දුක්ඛ ආර්ය සත්‍යයෙහි ය
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙහි ය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයෙහි ය
4.දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යයෙහි ය

(26) බුදුදහමෙ විස්තර වන පරිදි "දුක්ඛ දුක්ඛතා" යනු

1. ආත්මය අහිමි වීම නිසා ඇති වන දුක ය.
2. ජාති ,ජරා,ව්‍යාධි ආදී සාමාන්‍ය දුක් ය.
3. සහේතුක දේවල් වෙනස් වීමේ දුක ය.
4. ඇතිවීම නැතිවීම හේතු කොට හට ගන්නා දුක් ය.

(27) බුදුරජාණන් වහන්සේ පරිසරයට ගෞරවනීය තත්ත්වයක් ලබා දීම සඳහා ඉටුකරන ලද ඉහළ ම ක්‍රියාකාරකම වන්නේ

1.අනිමිස ලෝචන පූජාවයි
2.අරණ්‍යවාසී වීම අගය කිරීමයි.
3.පාරිලෙය්‍ය වනයට වැඩම කිරීම
4.රුක් සෙවනේ දහම් දෙසීමයි.

(28) ස්ථිරව ම කිසිදු මානසික රෝගී තත්ත්වයක් නැත්තේ

1.රහතන් වහන්සේට යි.
2. සෝවාන් තැනැත්තන්ට යි.
3.උගත් තැනැත්තන්ට යි
4. පෘථග්ජන තැනැත්තන්ට යි

(29) පහත දැක්වෙන කාර්යයන් අතරින් ඔනෑ ම පුද්ගලයෙකු ගේ ශිෂ්ට සම්පන්න බව හා නිරෝගී බව ඇති කර ගැනීමට ඉවහල් වන්නේ

1.විනෝද ක්‍රීඩාවල නිරත වීමයි.
2.නිතර පොත පත කියවීමයි
3.නිවැරදි ආහාර පරිභෝජනය යි.
4.විනෝදාත්මක චිත්‍රපටි නැරඹීම යි.

(30) මාතලේ අලුවිහාරයේ දී සිව් වන ථේරවාද සංගායනාව පවත්වා ඇත්තේ

1.ක්‍රි.පූ.පළමු සියවසේදී ය.
2. .ක්‍රි.පූ.දෙවන සියවසේදී ය
3. ක්‍රි.පූ.තෙවන සියවසේදී ය
4. .ක්‍රි.පූ.හතරවන සියවසේදී ය

(31) විහාරස්ථානයක පවතින වෙහෙර වහන්සේ ,බෝධීන් වහන්සේ,සහ පිළිම වහන්සේ පිළිවෙලින් හඳුන්වා දිය හැක්කේ

1.උද්දේසික,පාරිභෝගික හා සාරීරික චෛත්‍ය ලෙසයි.
2.සාරීරික,පාරිභෝගික හා උද්දේසික චෛත්‍ය ලෙසයි
3.පාරිභෝගික,සාරීරික හා උද්දේසික චෛත්‍ය ලෙසයි.
4. සාරීරික,උද්දේසික හා පාරිභෝගික චෛත්‍ය ලෙසයි.

(32) ලාංකීය ජනතාව අපගේ දේශීය පුරාවස්තු ආරක්ෂා නොකළ හොත්

1.සංස්කෘතික ත්‍රිකෝණ අරමුදල අපට අහිමි වේ.
2.රටේ ජෛව විවිධත්වයට හානි පැමිණේ.
3.ජනතාවගේ දැනුම හා ශ්‍රද්ධාව වැඩි දියුණු වේ.
4.මතු පරපුරට අපේ අතීත උරුමයන් අහිමි වේ.

251

(33) “රූ රූසේ අදිනා ලෙසේ අත් ලෙළ දී දී විදුලිය පබා ”
යනාදි කවිය ඇතුළත් කොට වෑත්තෑවේ හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථය

1. ධර්ම ප්‍රදීපිකාවය.
2. කව්සිළුමිණ යි
3. ගුත්තිල කාව්‍යයයි.
4. සද්ධර්ම රත්නාවලියයි.

(34) රටෙහි හොඳ දේශපාලන පරිසරයක් තිබිය යුතු බවට බුදුදහම යෝජනා කරන්නේ

1. දැහැමි සමාජයක් බිහිකර ගැනීමටයි.
2. පාලකයාගේ බලය වැඩි කර ගැනීමටයි.
3. මැතිවරණ ක්‍රමය ශක්තිමත් කිරීමටයි.
4. ආගම මගින් දේශපාලනය සිදුකරවීමටයි.

(35) “ මිනිස් තිරිසන් සියලු දෙනාගේ ආරක්ෂාව ”
“නීති විරෝධී ක්‍රියා වැළැක්වීම”
“සිල්වත් ගුණවත් උතුමන්ගෙන් උපදෙස් ගැනීම” ආදී දැහැමි රාජ්‍ය පාලන උපදෙස් ඇතුළත් වී ඇත්තේ

1. දස සංයෝජනවල ය.
2. දස සක්විතිවත්වල ය.
3. දස පාරමිතාවල ය.
4. දස අකුසල වස්තූන්වල ය.

(36) සප්ත අපරිහානීය ධර්ම වලට අයත් කරුණකි.

1. බල සෙනගට රැකවරණය දීම
2. පුරා වස්තු සංරක්ෂණය කිරීම
3. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම
4. ගිලනුන්ට ආරක්ෂාව සැලසීම

(37) බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සසර දුකින් එතෙර වීමේ මාර්ගයට පිවිසීමේ දොරටුව වන්නේ,

1. ගුණවත්කම යි.
2. දැනුමවත් කමයි.
3. භක්තිමත්කමයි.
4. සැදැහැවත්කමයි.

(38) බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ දහම් මග ගමන් කරන්නන් සත්‍යාවබෝධ කිරීම සඳහා අනිත්‍ය,දුඃඛ ,අනාත්ම යන ත්‍රිලක්ෂණය විනිවිද දකිනු ලබන්නේ

1. ශ්‍රද්ධාවෙනි
2. ප්‍රඥාවෙනි
3. කරුණාවෙනි
4. මුදිතාවෙනි

(39) “නිවන” යනු සතර මග සතර ඵල සම්පූර්ණ කළ කෙනෙකුගේ සිතෙහි ඇති වන

1. දෙව් මිනිස් සැප ලබා දෙන චිත්ත ශක්තියකි.
2. නැවත අපිරිසිදු නොවන පිවිතුරු තත්ත්වයකි.
3. ඉතාම තාවකාලික සැනසිලි තත්ත්වයකි.
4. කිසිවකුට ළඟා විය නොහැකි තත්ත්වයකි.

(40) බුදු දහම ඉගෙන ගන්නා දරුවන් ලෙස ඔබ උත්සාහ කළ යුත්තේ,

1. තමාගේ යහළුවන් ජයගැනීමටයි.
2. තමාගේ වැඩිහිටියන් ජයගැනීමටයි.
3. තම ප්‍රතිවාදීන් ජයගැනීමයි.
4. තමා තමාම ජයගැනීමටයි.

252